විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2008

මානවශාස්ත්‍ර පීඨය

සිංහල - SINH - E1025

# චිරන්තන සිංහල ගද්‍ය පද්‍ය සාහිත්‍යය හා භාෂා ප්‍රවේශය

පළමුවන ප්‍රශ්නය ද, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගින් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි | කාලය : පැය 03 යි

## 1 කොටස

01. අ) පහත දැක්වෙන ඡේදය ලිහිල් බසින් ලියා ඊට අදාළ අවස්ථා සම්බන්ධය දක්වන්න.

ඉක්බිති සේනකයෝත් ''අප කෙරේ රජ්ජුරුවෝ ඇතුළත් වූහ.'' යි සතුටු වැ තමන් කළ කාරණය ම ප්‍රකාශ කරන්නාහු යමෙක් තෙමේ දුකට පැමිණි ආතුරයා හට සරණ වැ පිටිවහල් වේ ද එ සේ වූ දුකෙහි නොහරනා තමා යහළුවා හට රහස් කිය යුතු යැ'' යි කීහ. ඉක්බිති රජ්ජුරුවෝ, ''පුක්කුසයෙනි තොප හට කෙසේ වැටහේ ද? රහස් කිය යුතු කාට ද'' යි විචාළහ. පුක්කුසයෝ ''දේවයන් වහන්ස, යමෙක් තෙමේ තමාට වැඩි මහලු ද නොහොත් මැදි බවැ සිටියේ ද, නොහොත් කිස්දොවුන් ද, ඉදින් එක් කුසෙහි හොත් තැනැත්තේ ආචාර ශීලයෙන් යුක්ත වී නම්, තමාට පැමිණි සුව දුක් දෙකෙහි කනස්සලු වැ පසු බැස නො සිටී නම්, එ සේ වූ තමා ගේ හිතකාමී වූ මලු වේ වයි, බෑයා වේ වයි සහෝදරයාට රහස් කිය යුතු යැ'' යි කීහ. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ කාවින්දයන් විචාළහ. කාවින්දයෝ ද, '' දේවයන් වහන්ස, යම් පුත්‍රයෙක් තෙමේ පියාණනට වහලක් සේ මෙහෙවර කොට ගෙන වංශයත් රක්ෂා කෙරේ ද (අභිජාත, අවජාත, අනුජාත, පුත්‍රයෝ තුන් දෙන නම් කවුරු ද යි යත හොත් :- පියාණනට වඩා සැපත් රැස් කොට ගෙන ඨානාන්තරයට පැමිණෙන්නේ අතිජාත නම් වෙයි. පියා සන්තක වස්තුව නසා ධූර්ත වැ වසන්නේ අවජාත නම් වෙයි. පියා සන්තක සම්පත් ස්ථිර කොට ගෙන වංශයත් රක්ෂා කරන්නේ අනුජාත නම් වෙයි. එ සේ වූ අනුජාත පුත්‍ර ද, අලාමක වූ නුවණ ඇත්තේ ද, එ වැනි තමා පුතුට රහස් කිය යුතු යැ'' යි කීහ. ඉක්බිති රජ්ජුරුවෝ දේවින්දයා විචාළහ. දේවින්දයෝ ද, ''දෙපා ඇත්තවුනට අධිපති වූ රජ්ජුරුවෙනි, යම් මැණි කෙනෙක් තුමූ ප්‍රේමයෙන් යුක්ත වූ සිතින් තමන් පුතුණුවනට සියලු පෝෂණ කෙරෙද් ද, එ සේ හිතකාමී වූ මැණියනට රහස් කිය යුතු යැ'' යි කී හ.

ආ) පහත දැක්වෙන පද්‍ය පන්තිය ලිහිල් බසින් ලියා රසාස්වාදය කරන්න.

වැහෙන සුනෙරහැලි මෙන් පැතිර ගෙණ නු බේ
ස ල න සෙමෙර පවනින් ඉතිර ගෙණ ස බේ
දු ව න සිහිල් සොඳ සුවඳැති පහස ලැ බේ
ගි ම න නිවෙයි නරනිඳු දුටු තැන ම නු බේ

දි නි ඳු න් කිරණ මෙන් මැතිමුවසියපත ට
ය ළි ඳු න් රහස්යටි වන් රජු සවනත ට
කොඩොලින් නික්ම මිණිරැස් පැතිරෙයි අව ට
ව න මෙ න් පහන් වෙයි එම කිරණ නසිත ට

සිනිඳු  පහන්  පැහැ ඇති දෙය ම එක් කො  ට
පසිඳු  සබය  පිරි බඬ ගන්නා ලෙස  ට
නිරිඳු  බරණරුස් පැතිරෙයි විටින් වි  ට
එයිඳු  බලා  සිට තගෙ  සිත සතුටු  කො  ට

ලොවට  පිහිට  ව නු හ ට තොප යන යකු  ර
සි ත ට  සිතට එම කොට වඩමින්  අද  ර
පි ය ට  පිය ට  බල කොට  ගෙණ සිතෙයි  වැ  ර
එ වි ට  රජු ට නමකොට  රැගෙණ අවස  ර

තු ස ර  තු ස ර  කර සිහිලස  කර  ඉ  ක්ම
අ ඹ ර  ත ඹ ර  කර දිනකර එන තෙ  ක්ම
බැහැර  නොහැර සිත සිහි කර පිරිත  ක්ම
ති ස ර  ති ස ර  ම මිතුර මෙ පුරෙන් නි  ක්ම

02. උම්මග්ග ජාතක කතුවරයා සංකීර්ණ චරිත නිරූපණයෙහි ලා දක් වූ දක්ෂතාව පිළිබඳ විමර්ශනයක් කරන්න.

03. සිංහල සන්දේශාවලියෙහි හංස සන්දේශයට කෙබඳු ස්ථානයක් හිමිවේ දැයි පිරික්සන්න.

04. කුරුණෑගල යුගයේ සාහිත්‍යය සිංහල ගද්‍ය නිර්මාණ අතුරින් කැපී පෙනෙන්නේ කවර හේතු නිසාදැයි පහදන්න.

05. ''කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍යය විවිධත්වයෙන් විචිත්‍ර වූවකි.'' විමසන්න.

06. සීතාවකට සාහිත්‍ය යුගයක් හිමි කර දීමට අලගියවන්න මුකවෙටි තුමාගෙන් ලැබුණු දායකත්වය පැහැදිලි කරන්න.

## 111 කොටස

07. භාෂා ද්විරූපතාව යනු කුමක්ද යි විස්තර කොට වර්තමාන සිංහල කථිත - ලිඛිත ව්‍යවහාරයන් හි භාවිත ශබ්ද (අක්ෂර) මාලාවන් වෙන් වෙන්ව ලියා දක්වන්න.

08. භාෂාව හා සංස්කෘතිය අතර පවත්නා අවියෝජනීය සම්බන්ධය පිළිබඳ විමසීමක් කරන්න.

09. ප්‍රාදේශීය උපභාෂා හා සමාජීය උප භාෂාවන්ගෙන් ප්‍රාස්තාවික භාෂා ස්වරූපය වෙනස්වන අන්දම පහදන්න.

10. පහත සඳහන් මාතෘකාවලින් පහක් (05) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

I. නිපාත ක්‍රියා
II. අනන්‍යාදේශය
III. ෂට් කාරක
IV. සංහත ව්‍යවහාර හා සිථිල ව්‍යවහාර
V. අර්ධ ස්වර
VI. අඝෝෂ මහාප්‍රාණ හා ඝෝෂ මහාප්‍රාණ
VII. තාලුජ අක්ෂර
VIII. උච්චාරණ ස්ථාන හා උච්චාරණ කරණ
IX. දන්තෞෂ්ඨජ අඝෝෂ ඝර්ෂ
X. අර්ධානුනාසික්‍ය

X. අර්ධානුනාසික්‍ය

. . . . . . . . . .